I. B

ISSN 1391 - 1775

# චිරන්තන

## ඓතිහාසික අධ්‍යයන සගරාව

අංක 1

සංස්කරණය :

ධම්මිකා මනතුංග

ඉන්දිකා බුලන්කුලමෙ

ප්‍රකාශනය :

ර්. එම්. අයි. පී. ඒකනායක

# එච්. සී. පී. බෙල්ගේ පුරාවිද්‍යා පර්යේෂණ

අනුර මනතුංග

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණ ක්ෂෙත්‍රය තුළ එච්. සී. පී. බෙල්ට හිමිවන්නේ සදනුස්මරණීය ස්ථානයකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රථම කොමසාරිස්වරයා වූ ඔහු, දෙවිසි වසරක් (1890-1912) වූ සිය සේවා කාලය තුළ මෙරට පුරාවිද්‍යාව වෙනුවෙන් ඉටු කළ කාර්ය්‍යභාරය අති විශාලය. විශේෂයෙන්ම, අනුරාධපුර, සීගිරිය සහ පොලොන්නරුව වැනි ප්‍රකට නටබුන් නගරවල දක්නට ලැබෙන පැරණි ස්මාරක රැසක් ම මුල්වරට කැණීම් කොට පාද ගනු ලැබුවේත්, ඒ අතරින් වැදගත්ම ස්මාරක කීපයක් සංරක්ෂණය කොට තහවුරු කරනු ලැබුවේත් ඔහු විසින්ය. එමෙන්ම, තවමත් ඇතැම්විට අප්‍රකටව පිහිටි තවත් නටබුන් ස්ථාන සිය ගණනක් ඔහු විසින් මුල්වරට ගවේෂණය කොට වාර්තාගත කරනු ලැබ ඇත. මෙරට පුරාවිද්‍යා නීතිය ශක්තිමක් කිරීමට සහ පුරාවස්තුවල ආරක්ෂාව තහවුරු කිරීමට ද ඔහුගෙන් පුරෝගාමී මෙහෙයක් ඉටු විය. මෙලෙස දේශීය පුරාවිද්‍යාවට කීර්තිමත් ආරම්භයක් ලබා දුන් ඔහු, එහි හැඩ ගැස්ම සහ ගමන් මග තීරණය කිරීමේ ලා ප්‍රබල බලපෑමක් කළේ ය.

හෙන්රි චාල්ස් පර්විස් හෙවත් එච්. සී. පී. බෙල් 1851 දී ඉන්දියාවේ ඒඩන් හිදී උපත ලැබීය. ඔහුගේ පියා එවකට එහි සේවය කළ ඉංග්‍රීසි ජාතික හමුදා නිලධාරියකු විය. පාසැල් අධ්‍යාපනය සඳහා කුඩා කාලයේ දී ම සිය රට යවනු ලැබූ බෙල් එංගලන්තයේ වෙල්තම්හම් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. විශ්වවිද්‍යාලයට ඇතුලත් නො වූවද, සිවිල් සේවා විභාගයෙන් සමත් වූ ඔහු, 1873 දී ආධුනික සිවිල් නිලධාරියකු ලෙස මෙරටට පැමිණ ඇත.

එතැන් සිට විවිධ තනතුරු දරමින් දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල සේවය කර ඇති බෙල්, රැකියාවට පමණක් සීමා නොවී ශාස්ත්‍රීය කටයුතු පිළිබඳව ද උනන්දුවක් දැක්වීය. කලක් රේගු නිලධාරියකු ලෙස සේවය කළ ඔහු, මුහුදුබත් වූ නැවක් පරීක්ෂා කර බැලීම සඳහා වරක් (1879) මාලදිවයින් බලා යෑමට අවස්ථාව ලැබීය. මේ අහඹු අවස්ථාව එම දූපත් පිළිබඳව වැඩිදුර කරුණු සෙවීම කෙරේ ඔහු පෙළඹවනු ලැබ ඇත. මාලදිවයිනේ භාෂාව, සංස්කෘතිය සහ ඉතිහාසය අළලා පසුව ඔහු විසින් කළ පර්යේෂණ නිසා එම සැඟවුණු දූපත් පිළිබඳව අධ්‍යයනය කළ පුරෝගාමියකු ලෙස ද බෙල් කීර්තිමත් විය.

1880 දී බෙල් රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සාමාජිකත්වය ලැබීය. එම වසරේ දීම ඔහු එහි සහරා සංස්කාරක වශයෙන් පත් කරගනු ලැබූ අතර, එතැන් සිට තිස් හතර වසරක් (1880-1914) එම තනතුර දරමින් ඔහු විසින් වාර්තා වක් ද පිහිටුවනු ලැබ ඇත. මුලින් ස්වාභාවික විද්‍යාවන්ට අදල ලිපි බහුලව පළ වූ මේ සහරාවේ ඓතිහාසික අධ්‍යයන අළලා ලියවුණු ලිපි සුලබ වීමට පටන් ගත්තේ බෙල් එහි සංස්කාරක වශයෙන් කටයුතු කළ කාලයේදී ය.

සර් ආතර් ගෝර්ඩන් ආණ්ඩුකාරයා විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවා, එහි ප්‍රථම කොමසාරිස්වරයා වශයෙන් 1890 පෙබරවාරි මාසයේ දී එච්. සී.